**ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් සීමිත සමාගම - 2017/2018**

-----------------------------------------------------------------------------------------------------

ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් සීමිත සමාගමේ ("සමාගම") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

(අ) 2012 වසරේ සිට සමාගම විසින් සපයා තිබූ රු.මිලියන 325.6 ක් වූ සේවා වටිනාකම සඳහා බදු ඉන්වොයිසි නිකුත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ලැබිය යුතුව තිබූ රු.මිලියන 97.77 ක පරිපාලන සේවා සැපයුම් ආදායම සනාථ කරගැනීම සඳහා ඍජු ශේෂ සනාථන වාර්තාකරණ දිනය වන විටත් ලැබී නොතිබුණි.

(ඇ) 2018 මාර්තු 31 දිනට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් රු.4,886,265 ක් ලැබිය යුතු වුවත්, එම අමාත්‍යාංශය එවැනි ශේෂයක් සමාගමට ගෙවීමට නොමැති බව තහවුරු කර තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

---

2018 මාර්තු 31 දිනට වෙළඳ ලැබිය යුතු ගිණුම් ශේෂය රු.මිලියන 102 ක් වූ අතර ඉන් රු.මිලියන 84 ක් වසර දෙක ඉක්ම වූ ලැබිය යුතු ශේෂයන් බව නිරීක්ෂණය විය. තවද මෙම ණය ශේෂ සමාලෝචනය කර බොල් හා අඩමාන ණය වෙන් කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7(c) ඡේදය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අර්ථකතන රීති අංක IC/2013/80. | මෙම රීතිය ප්‍රකාරව සමාගම ලාභාංශ බද්දෙන් නිදහස් බව මහා භාණ්ඩාගාරය සනාථ කර තිබුණු නමුත් සමාගම විසින් 2017 ඔක්තෝබර් 12 දින මහා භාණ්ඩාගාරය වෙත රු.1,000,000 ක දළ ලාභාංශයක් නිකුත් කර ඇති අතර ඒ සඳහා රු.100,000 ක ලාභාංශ බද්දක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 120 (අ) ඡේදය. | උපයනවිට බදු ගෙවීම් (PAYE) ඊට පසු මාසයේ 15 වන දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් සමාගමේ 2017 අප්‍රේල් මාසයට අදාල උපයන විට ගෙවීම් ප්‍රේෂණය කර තිබුණේ 2017 මැයි 22 දින දීය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,890,255 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,521,743 ක ලාභයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.45,411,998 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.47,638,888 කින් පහල යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද සමාගමට ලැබිය යුතු ශේෂයන් නොගෙවන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය උපදෙස් දී තිබීම හා එම ප්‍රධාන ගනුදෙනුකරුවන් අහිමිවීයාම ආදායමේ අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව සමාගම විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 මාර්තු 31 දින දක්වාම සමාගම විසින් එය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාගමේ ප්‍රධාන කාර්යභාරය ත්‍රිවිධ හමුදාව හා පොලිසිය සඳහා වැදගත්වන යුධෝපකරණ සඳහා ප්‍රසම්පාදන සේවා සැපයීම වුවද, පැවති යුධමය තත්ත්වය 2009 වර්ෂයේදී නිමා වීමත් සමග ප්‍රසම්පාදන කටයුතු ඒ ඒ ආයතන මගින් සිදුකර ගැනීම හේතුවෙන් සමාගමේ ප්‍රධාන ගනුදෙනුකරුවන් අහිමි වී යාමේ ඉහළ අවධානමක් ඇති වී තිබුණි. තවද, අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017 ජූලි 03 දිනැති අංක එම්ඔඩී/පීබී/12/2017 දරන ලිපියට අනුව, ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් බැවින් මෙම සමාගමේ ප්‍රසම්පාදනයන් සඳහා සුසර්ධ්‍යකරණ ගාස්තු ලෙස විශේෂ දීමනාවක් නොගෙවිය යුතු බවත් යම් හෙයකින් අදාල

සමාගම නඩත්තු කිරීමේ මූල්‍ය ඌනතාවයක් පවතින්නේ නම් පමණක් ඒ සඳහා වෙනත් ආයතන මෙන් මහා භාණ්ඩාගාරයෙන් අදාල ප්‍රතිපාදන ලබාගත යුතු බවත් දන්වා තිබුණි.

**4.2 විග්‍රහාත්මක සමාලෝචනය**

| | | 2016/ 2017 | 2017/2018 | වැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|---|
| (අ) | දළ ලාභ අනුපාතය (%) | 96 | 32 | (64) |
| (ආ) | ශුද්ධ ලාභ අනුපාතය (%) | 22 | (283) | (305) |
| (ඇ) | කොටසක ඉපයුම් අනුපාතය | 1.4 | (4.1) | (5.5) |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාගමේ දළ ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය, කොටසක ඉපයුම් අනුපාතය පිළිවෙලින් සියයට 64, සියයට 305 හා සියයට 5.5 කින් අඩු වී තිබුණි.

**4.3 කාර්යමණ්ඩල පරිපාලනය**

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව සේවකයන්ගේ වැටුප් තල, බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 166 (1) වගන්තිය ප්‍රකාරව සමාගම විසින් ශේෂ පත්‍ර දිනෙන් මාස 06 ක් ඇතුළත සමාගමේ කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණකයෙකු අනුයුක්ත කර තිබූ නමුත් අභ්‍යන්තර විගණනයක් සිදුකර තිබූ බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවීය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු නොකිරීම. |
| (ආ) | බදුකරණය | ගෙවිය යුතු බදු නිවැරදිව ගණනය නොකිරීම හා නියමිත දිනට ගෙවීම් නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | සේවකයින් බඳවාගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ |

පටිපාටිය සඳහා අනුමැතිය ලබා නොගැනීම.